AL/2014/21/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2014 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2014 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2014

| | | |
|---|---|---|
| ආර්ථික විද්‍යාව I<br>பொருளியல் I<br>Economics I | 21 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1 සිට 50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

1. ආර්ථික විද්‍යාවේ දී හදාරනු ලබන්නේ,
   (1) සම්පත් හිඟකම හා පූර්ණ සේවා නියුක්තිය පිළිබඳව ය.
   (2) සම්පත් හිඟකම හා නිෂ්පාදනය පිළිබඳව ය.
   (3) සම්පත් හිඟකම හා තෝරාගැනීම පිළිබඳව ය.
   (4) සම්පත් හිඟකම හා කාර්යක්ෂමතාව පිළිබඳව ය.
   (5) සම්පත් හිඟකම හා ආදේශකතාව පිළිබඳව ය.

2. ආර්ථික විද්‍යාවේ දී ආවස්ථික පිරිවැය වශයෙන් නිර්වචනය කරන්නේ,
   (1) යමක් ලබා ගැනීම වෙනුවෙන් කැප කළ අනෙකුත් අවස්ථායි.
   (2) යමක් ලබා ගැනීම සඳහා වැය වූ මූල්‍ය පිරිවැයයි.
   (3) යමක් ලබා ගැනීම සඳහා ගත වූ කාලයේ පිරිවැයයි.
   (4) යමක් ලබා ගැනීම සඳහා වැය වූ ස්ථාවර හා විචල්‍ය පිරිවැයේ එකතුවයි.
   (5) යමක් ලබා ගැනීම වෙනුවෙන් අත්හරින ලද හොඳම විකල්පයේ වටිනාකමයි.

3. පහත දැක්වෙන ඒවා අතුරෙන් ආර්ථික භාණ්ඩයක ලක්ෂණ නිවැරදි ව පිළිබිඹු කරන පිළිතුර තෝරන්න.
   A - නිෂ්පාදන පිරිවැයක් පැවතීම
   B - ආවස්ථික පිරිවැයක් පැවතීම
   C - පාරිභෝගිකයා විසින් වියදමක් දැරීම
   D - අඩුවන ආන්තික පිරිවැයක් පැවතීම
   (1) A සහ B ය. (2) A සහ C ය. (3) A, B සහ C ය. (4) A, C සහ D ය. (5) B, C සහ D ය.

4. වෙළෙඳපොළ ආර්ථිකයක මිලෙහි කාර්යයන් වන්නේ,
   (1) සලාක කිරීම සහ වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම ය.
   (2) සංඥා සැපයීම, සානුබල සැපයීම සහ වටිනාකමේ මිනුමක් ලෙස ක්‍රියා කිරීම ය.
   (3) සංඥා සැපයීම, සානුබල සැපයීම සහ වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම ය.
   (4) සානුබල සැපයීම සහ වටිනාකමේ මිනුමක් ලෙස ක්‍රියා කිරීම ය.
   (5) සංඥා සැපයීම, සානුබල සැපයීම සහ සලාක කිරීම ය.

5. වෙළෙඳපොළ ආර්ථිකයක පුද්ගල ආදායම තීරණය වනුයේ,
   (1) රජයේ සාධක මිල ප්‍රතිපත්තිය සහ පිහිටාධාර මත ය.
   (2) සාධක වෙළෙඳපොළේ සාධක මිල සහ පෞද්ගලික ආදායම් බදු මත ය.
   (3) සාධක වෙළෙඳපොළේ සාධක මිල සහ රජයේ වැටුප් ප්‍රතිපත්තිය මත ය.
   (4) සාධක වෙළෙඳපොළේ සාධක සඳහා පැවති මිල සහ එම මිලට හුවමාරු වන ප්‍රමාණය මත ය.
   (5) දේපළ හිමිකම සහ සාධක වෙළෙඳපොළේ සාධක මිල මත ය.

6. නිෂ්පාදන හැකියා මායිමෙන් ඇතුළත ලක්ෂ්‍යයකින් පෙන්වන්නේ,
   (1) සේවා වියුක්තියයි.
   (2) සම්පත් හිඟකමයි.
   (3) යල්පැන ගිය තාක්ෂණයයි.
   (4) සම්පත් අධි භාවිතයයි.
   (5) නුපුහුණු ශ්‍රමය පැවතීමයි.

7. කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ඉල්ලුම් සමීකරණය පහත දී ඇත.

$$Qd = 200 - 8P$$

   මෙම භාණ්ඩයේ මිල රු. 10 ක් වන විට මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකයේ වටිනාකම කුමක් ද?
   (1) $-6.0$ කි. (2) $-0.66$ කි. (3) $-0.06$ කි. (4) $+0.06$ කි. (5) $+0.66$ කි.

[දෙවන පිටුව බලන්න.

8. මිල ඉල්ලුම් නම්‍යතාවෙන් මනිනු ලබන්නේ,
(1) ඉල්ලුම් තීරණය කරන සාධකයක වෙනසට ඉල්ලුම් ප්‍රමාණය දක්වන ප්‍රතිචාරයයි.
(2) භාණ්ඩයක මිලෙහි සාපේක්ෂ වෙනසකට ඉල්ලුම් ප්‍රමාණය දක්වන ප්‍රතිචාරයයි.
(3) යම් භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණය වෙනත් භාණ්ඩයක මිලෙහි ඇතිවන වෙනසකට දක්වන ප්‍රතිචාරයයි.
(4) නිෂ්පාදන සාධකයක මිලෙහි ඇතිවන සාපේක්ෂ වෙනසකට ඉල්ලුම් ප්‍රමාණය දක්වන ප්‍රතිචාරයයි.
(5) මිලෙහි සාපේක්ෂ වෙනසකට ඉල්ලුම් ප්‍රමාණයේ ඇතිවන ඉහළ යාමයි.

9. සැපයුම්කරුවකු තම භාණ්ඩයේ මිල 10%කින් ඉහළ දැමීම මගින් ආයභාරය ඉහළ දමා ගැනීමට බලාපොරොත්තු වේ. මෙම අරමුණ ඉටුකර ගැනීමට නම් වඩාත් යෝග්‍ය වන්නේ,
(1) මිල ඉල්ලුම් නම්‍යතාව එකට වඩා අඩු විය යුතු වීම ය.
(2) මිල ඉල්ලුම් නම්‍යතාව එකට වඩා වැඩි විය යුතු වීම ය.
(3) මිල ඉල්ලුම් නම්‍යතාව එකට සමාන විය යුතු වීම ය.
(4) සැපයුමෙහි මිල නම්‍යතාව ශුන්‍ය විය යුතු වීම ය.
(5) සැපයුමෙහි මිල නම්‍යතාව පූර්ණ නම්‍ය විය යුතු වීම ය.

10. අර්තාපල් සහ බී ලූණු වැනි කෘෂිකාර්මික භාණ්ඩවල වෙළෙඳපොළ මිල වසරේ සමහර කාලවල දී ඉහළ මට්ටමකත්, සමහර කාලවල දී පහළ මට්ටමකත් පවතී. එසේ වීමට ප්‍රධාන හේතුව වන්නේ,
(1) අනම්‍ය ඉල්ලුමක් සහ නම්‍ය සැපයුමක් පැවතීමයි.
(2) නම්‍ය ඉල්ලුමක් සහ නම්‍ය සැපයුමක් පැවතීමයි.
(3) අනම්‍ය ඉල්ලුමක් සහ අනම්‍ය සැපයුමක් පැවතීමයි.
(4) නම්‍ය ඉල්ලුමක් සහ අනම්‍ය සැපයුමක් පැවතීමයි.
(5) පූර්ණ නම්‍ය ඉල්ලුමක් සහ පූර්ණ අනම්‍ය සැපයුමක් පැවතීමයි.

11. කිසියම් භාණ්ඩයක ඉල්ලුම් සහ සැපයුම් තොරතුරු පහත වගුවෙන් දැක්වේ.

| මිල (රු.) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක) | සැපයුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| 80 | 400 | 800 |
| 100 | 200 | 1000 |

ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර සරල රේඛීය යැ'යි උපකල්පනය කරන්න. මෙම භාණ්ඩයේ සමතුලිත මිල හා ප්‍රමාණය නිවැරදි ව දැක්වෙන පිළිතුර කුමක් ද?

| | මිල (රු.) | ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| (1) | 50 | 500 |
| (2) | 60 | 400 |
| (3) | 60 | 600 |
| (4) | 65 | 300 |
| (5) | 70 | 500 |

12. දෙන ලද භාණ්ඩයක සැපයුම් සමීකරණය $Qs = 100 + 10P$ ලෙස දී ඇතැයි සිතන්න. මෙම භාණ්ඩය මත රුපියල් පහක (රු. 5) ඒකක බද්දක් පනවන ලදී. බද්දෙන් පසු සැපයුම් සමීකරණය වන්නේ,
(1) $Qs = 50 + 10P$ වේ. (2) $Qs = 100 + 5P$ වේ. (3) $Qs = 100 + 15P$ වේ.
(4) $Qs = 100 + 50P$ වේ. (5) $Qs = 500 + 50P$ වේ.

13. ආයතනයක කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතයෙහි ආන්තික ඵලදාව ශුන්‍ය වන විට,
(1) මුළු ඵලදාව උපරිම වේ. (2) සාමාන්‍ය ඵලදාව උපරිම වේ.
(3) සාමාන්‍ය පිරිවැය අවම වේ. (4) ආන්තික පිරිවැය අවම වේ.
(5) ආන්තික ඵලදාව සාමාන්‍ය ඵලදාවට සමාන වේ.

14. 'පරිමාණානුකූල ඵල නීතිය' යන්නෙන් අදහස් කෙරෙනුයේ,
(1) යෙදවුම්වල මිල වෙනස්වන විට ආයතනයක මුළු නිමවුම වෙනස් වන ආකාරයයි.
(2) අවම වශයෙන් එක් යෙදවුමක් ස්ථාවර ව තිබිය දී විචල්‍ය යෙදවුම් වෙනස් කරන විට ආයතනයක මුළු නිමවුම වෙනස් වන ආකාරයයි.
(3) තාක්ෂණය වෙනස්වන විට ආයතනයක මුළු නිමවුම වෙනස්වන ආකාරයයි.
(4) යෙදවුම්වල ගුණාත්මකභාවය වෙනස්වන විට ආයතනයක මුළු නිමවුම වෙනස් වන ආකාරයයි.
(5) ආයතනයක සියලු යෙදවුම් වෙනස්වන විට මුළු නිමවුම වෙනස් වන ආකාරයයි.

[තුන්වන පිටුව බලන්න.

15. කෙටිකාලයේ දී ආයතනයක මුළු පිරිවැය වක්‍රයෙහි හැඩය තීරණය වන්නේ,
    (1) සාමාන්‍ය ස්ථාවර පිරිවැයෙහි හැසිරීම මත ය.
    (2) තාක්ෂණය වෙනස්වන ආකාරය මත ය.
    (3) සාමාන්‍ය මුළු පිරිවැයෙහි හැසිරීම මත ය.
    (4) මුළු විචල්‍ය පිරිවැයෙහි හැසිරීම මත ය.
    (5) පරිමාණානුකූල ඵල හැසිරීම මත ය.

16. ආයතනයක නිමවුම වැඩි කිරීමත් සමඟ සාමාන්‍ය ස්ථාවර පිරිවැය අඛණ්ඩ ව පහත වැටෙන නමුදු එය ශූන්‍ය **නොවන්නේ,**
    (1) මුළු පිරිවැය වෙනස් නොවන බැවිනි.
    (2) විචල්‍ය පිරිවැයක් පවතින බැවිනි.
    (3) සාමාන්‍ය පිරිවැයක් පවතින බැවිනි.
    (4) ආන්තික පිරිවැයක් පවතින බැවිනි.
    (5) ස්ථාවර පිරිවැයක් පවතින බැවිනි.

17. ආයතනයක කෙටිකාලීන සැපයුම් වක්‍රය වන්නේ,
    (1) ආන්තික පිරිවැය වක්‍රයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය ඉක්ම වූ කොටසයි.
    (2) සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයේ ඉහළ යන කොටසයි.
    (3) ආන්තික පිරිවැය වක්‍රයේ ඉහළ යන කොටසයි.
    (4) සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ ඉහළ යන කොටසයි.
    (5) ආන්තික පිරිවැය වක්‍රයේ සාමාන්‍ය මුළු පිරිවැය ඉක්ම වූ කොටසයි.

18. සමජාතීය හෝ ප්‍රභේදිත භාණ්ඩ සපයන විශාල ආයතන ස්වල්ප සංඛ්‍යාවක් සිටින විට එය,
    (1) ද්විඅධිකාරී වෙළෙඳපොළකි.
    (2) ඒකාධිකාරී තරග වෙළෙඳපොළකි.
    (3) පූර්ණ තරගකාරී වෙළෙඳපොළකි.
    (4) කතිපයාධිකාරී වෙළෙඳපොළකි.
    (5) ඒකාධිකාරී වෙළෙඳපොළකි.

19. පූර්ණ තරගකාරී ආයතනයක් මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයක් වන්නේ,
    (1) වෙළෙඳපොළේ සමජාතීය භාණ්ඩ අලෙවි කරන බැවිනි.
    (2) සැපයුම්කරු මිල තීරණය කරන්නකු බැවිනි.
    (3) සැපයුම්කරු මිල ගනුවකු බැවිනි.
    (4) සැපයුම්කරුට අවශ්‍ය තොරතුරු නොලැබෙන බැවිනි.
    (5) ප්‍රචාරණ කටයුතු සිදු නොකරන බැවිනි.

20. ඒකාධිකාරී ආයතනයකට තීරණය කළ හැකිවන්නේ,
    (1) භාණ්ඩයක මිල පමණි.
    (2) භාණ්ඩයක මිල හෝ සැපයුම් ප්‍රමාණය හෝ පමණි.
    (3) භාණ්ඩයක සැපයුම් ප්‍රමාණය පමණි.
    (4) භාණ්ඩයක මිල හා සැපයුම් ප්‍රමාණය යන දෙකම වේ.
    (5) භාණ්ඩයක නිෂ්පාදන පිරිවැය හා සැපයුම් ප්‍රමාණය යන දෙකම වේ.

21. ආයතනයක සමතුලිතය තීරණය වීමේ දී ඉටුවිය යුතු කොන්දේසිය වන්නේ,
    (1) ආන්තික පිරිවැය වැඩි වෙමින් පවතින අවධියේ දී ආන්තික අයහාරය ආන්තික පිරිවැයට සමාන වීමයි.
    (2) ආන්තික පිරිවැය අඩු වෙමින් පවතින අවධියේ දී ආන්තික අයහාරය ආන්තික පිරිවැයට සමාන වීමයි.
    (3) ආන්තික පිරිවැය අවම වන ලක්ෂ්‍යයේ දී ආන්තික අයහාරය ආන්තික පිරිවැයට සමාන වීමයි.
    (4) සාමාන්‍ය පිරිවැය වැඩිවෙමින් පවතින අවධියේ දී ආන්තික අයහාරය ආන්තික පිරිවැයට සමාන වීමයි.
    (5) සාමාන්‍ය පිරිවැය අඩුවෙමින් පවතින අවධියේ දී ආන්තික අයහාරය ආන්තික පිරිවැයට සමාන වීමයි.

22. ව්‍යාපාර චක්‍රයක පතුලෙහි සිට මුදුනත දක්වා ගමන් කරන විට දැකිය හැකි ලක්ෂණ වන්නේ,
    (1) සත්‍ය නිමවුම වැඩි වීම, උද්ධමනය සහ සේවා වියුක්තිය අඩු වීම ය.
    (2) සත්‍ය නිමවුම වැඩි වීම, සේවා නියුක්තිය සහ උද්ධමනය අඩු වීම ය.
    (3) සත්‍ය නිමවුම වැඩි වීම, සේවා නියුක්තිය සහ උද්ධමනය වැඩි වීම ය.
    (4) විභව නිමවුම වැඩි වීම, උද්ධමනය අඩු වීම සහ සේවා වියුක්තිය වැඩි වීම ය.
    (5) සත්‍ය නිමවුම වැඩි වීම, විභව නිමවුම වැඩි වීම සහ උද්ධමනය අඩු වීම ය.

23. කල්පිත ආර්ථිකයක ජාතික ආදායම සම්බන්ධ දත්ත පහත දැක්වේ. (සියලු ම අගයන් රුපියල් මිලියනවලිනි)

| | |
|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම | 1 200 |
| පෞද්ගලික ආයෝජන වියදම | 400 |
| රජයේ මිල දී ගැනීම් | 300 |
| අපනයන ඉපයුම් | 180 |
| දළ දේශීය නිෂ්පාදිතය | 1 920 |

මෙම ආර්ථිකයේ වෙළෙඳ ශේෂයේ අගය කුමක් ද?
    (1) රුපියල් මිලියන –160 කි.
    (2) රුපියල් මිලියන –20 කි.
    (3) රුපියල් මිලියන 20 කි.
    (4) රුපියල් මිලියන 80 කි.
    (5) රුපියල් මිලියන 160 කි.

[ඉතරවන පිටුව බලන්න.

24. කල්පිත ආර්ථිකයක නාමික දළ දේශීය නිෂ්පාදනයේ වර්ධන වේගය 13.5% ක් ද, උද්ධමන අනුපාතිකය 6% ක් ද, ජනගහන වර්ධන අනුපාතිකය 1.2% ක් ද යැ'යි සිතන්න. මෙම ආර්ථිකයේ මූර්ත ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය කුමක් ද?
(1) –1.2% කි. (2) 1.05% කි. (3) 6.3% කි. (4) 7.05% කි. (5) 7.5% කි.

25. ආර්ථිකයක කිසියම් වර්ෂයක දී දළ ජාතික නිෂ්පාදිතය ස්ථාවර මිල ගණන් මත ගණනය කළ විට, එය පදනම් වර්ෂයේ දළ ජාතික නිෂ්පාදිතයේ අගයට වඩා වැඩි විය හැක්කේ,
(1) පොදු මිල මට්ටමේ පහළ යාමත්, සේවා වියුක්තියේ ඉහළ යාමත් හේතුවෙනි.
(2) පොදු මිල මට්ටමේ ඉහළ යාමත්, නිමවුමේ පහළ යාමත් හේතුවෙනි.
(3) පොදු මිල මට්ටමේ පහළ යාමත්, නිමවුමේ ඉහළ යාමත් හේතුවෙනි.
(4) පොදු මිල මට්ටම, නිමවුම ඉහළ යන වේගයට වඩා වැඩි වේගයකින් ඉහළ යාම හේතුවෙනි.
(5) පොදු මිල මට්ටමේ ඉහළ යාමත්, සේවා වියුක්තියේ පහළ යාමත් හේතුවෙනි.

26. මුදල් සැපයුම සහ ආදායම පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) මුදල් සැපයුම හා ආදායම යන දෙක ම ප්‍රවාහයන් හා තොගයන් වීම ය.
(2) මුදල් සැපයුම ප්‍රවාහයක් වන අතර ආදායම තොගයක් වීම ය.
(3) මුදල් සැපයුම හා ආදායම යන දෙක ම ප්‍රවාහයන් වීම ය.
(4) මුදල් සැපයුම හා ආදායම යන දෙක ම තොගයන් වීම ය.
(5) මුදල් සැපයුම තොගයක් වන අතර ආදායම ප්‍රවාහයක් වීම ය.

27. රටක මුදල් ඉල්ලුම තීරණය වන්නේ,
(1) පොලී අනුපාතිකය සහ අධිබලැති මුදල් ප්‍රමාණය මත ය.
(2) මුදල් ගුණකයේ අගය සහ පොලී අනුපාතිකය මත ය.
(3) පොලී අනුපාතිකය සහ සේවා වියුක්තිය මත ය.
(4) මූර්ත ආදායම සහ පොලී අනුපාතිකය මත ය.
(5) අධිබලැති මුදල් ප්‍රමාණය සහ මුදල් ගුණකයේ අගය මත ය.

28. මිල මට්ටමේ පහළ යාමකින්,
(1) මුදලේ වටිනාකමට බලපෑමක් සිදු නොවේ.
(2) මුදලේ වටිනාකම වැඩි වේ.
(3) මුදලේ වටිනාකමට දිගුකාලීන බලපෑමක් ඇති නොවේ.
(4) මුදලේ වටිනාකමට කෙටිකාලයේ දී කිසිදු බලපෑමක් සිදු නොවේ.
(5) මුදලේ වටිනාකම අඩු වේ.

29. ශ්‍රී ලංකාවේ මුදල් සැපයුමේ $M_{2b}$ සකස් වන්නේ,
(1) අධිබලැති මුදල්වලට විදේශ මුදල් තැන්පතු එකතු වීමෙනි.
(2) ඉල්ලුම් තැන්පතුවලට විදේශ මුදල් තැන්පතු එකතු වීමෙනි.
(3) ස්ථාවර තැන්පතුවලට විදේශ මුදල් තැන්පතු එකතු වීමෙනි.
(4) පටු මුදල් සැපයුමට වාණිජ බැංකුවල කාලීන හා ඉතුරුම් තැන්පතු එකතු වීමෙනි.
(5) පුළුල් මුදල් සැපයුමට විදේශ මුදල් තැන්පතු එකතු වීමෙනි.

30. විවෘත ආර්ථිකයක සාර්ව ආර්ථික ස්ථායිතාව වඩාත් හොඳින් පිළිබිඹු කරන්නේ,
(1) මිල මට්ටම සහ විදේශ විනිමය අනුපාතිකය මගිනි.
(2) මිල මට්ටම සහ සේවා නියුක්ති අනුපාතිකය මගිනි.
(3) විදේශ විනිමය අනුපාතිකය සහ සේවා නියුක්ති අනුපාතිකය මගිනි.
(4) ගෙවුම් ශේෂය සහ විදේශ විනිමය අනුපාතිකය මගිනි.
(5) උද්ධමනය සහ සේවා වියුක්ති අනුපාතිකය මගිනි.

31. ආර්ථිකයක පොලී අනුපාතිකය පහත හෙළීමෙන් ළඟා කර ගැනීමට බලාපොරොත්තුවන සාර්ව ආර්ථික අරමුණක් වන්නේ,
(1) ආයෝජන වැඩි වී මිල මට්ටම ඉහළ ගොස් පරිභෝජනය අඩු වීමයි.
(2) ආයෝජන ඉහළ යාම හේතුවෙන් සමාහාර ඉල්ලුම ඉහළ ගොස් ආර්ථිකයේ නිෂ්පාදනය වැඩි වීමයි.
(3) පරිභෝජනය සහ ආයෝජන ඉහළ ගොස් ආයතන ලාභ ඉහළ යාමයි.
(4) ඉතුරුම් වැඩි වී පරිභෝජනය අඩු වී රජයේ බදු ආදායම ඉහළ යාමයි.
(5) කොටස් මිල ඉහළ ගොස් ව්‍යාපාරික ලාභ වැඩි වී නව ආයෝජන බිහි වීමයි.

[පස්වන පිටුව බලන්න.

32. ප්‍රසාරණාත්මක මූල්‍ය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සඳහා උදාහරණ වන්නේ,
    (1) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය වැඩි කිරීම සහ බදු අනුපාතික පහත හෙළීම ය.
    (2) මහ බැංකුව විසින් විවෘත වෙළෙඳපොළේ රජයේ සුරැකුම්පත් විකිණීම සහ බදු අනුපාතික පහත හෙළීම ය.
    (3) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය වැඩි කිරීම සහ රජයේ මිල දී ගැනීම් ඉහළ දැමීම ය.
    (4) මහ බැංකුව විසින් විවෘත වෙළෙඳපොළේ රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම සහ බදු අනුපාතික පහත හෙළීම ය.
    (5) පොලී අනුපාතිකය ඉහළ දැමීම සහ රජයේ මිල දී ගැනීම් ඉහළ දැමීම ය.

33. පොදු භාණ්ඩ, වෙළෙඳපොළ ක්‍රමය මඟින් සපයනු **නොලබන්නේ,**
    (1) පරිභෝජනයේ දී පිරිවැයක් ඇති වුව ද, ලාභයක් ඉපයීමට නොහැකි නිසා ය.
    (2) මිලක් අය කළ නොහැකි වීම සහ පරිභෝජනයේ දී තරගකාරිත්වයක් නොපැවතීම නිසා ය.
    (3) මිලක් නොගෙවන අය පරිභෝජනයෙන් බැහැර කළ නොහැකි වීම සහ පරිභෝජනයේ දී තරගකාරිත්වයක් නොපැවතීම නිසා ය.
    (4) ලාභයක් ඉපයිය හැකි වුව ද පරිභෝජනයේ දී පිරිවැයක් පැවතීම නිසා ය.
    (5) මිලක් අය කළ හැකි වුවත් එය පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා ය.

34. "ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස මෑත වර්ෂවල දී පහත බැසීමේ උපනතියක් පෙන්නුම් කරයි." මෙයට ප්‍රධාන හේතුව වන්නේ,
    (1) දළ දේශීය නිෂ්පාදිතය ස්ථාවර ව පැවතිය දී රාජ්‍ය ණය පහළ යාම ය.
    (2) රාජ්‍ය ණය පහළ යාම සහ දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම ය.
    (3) රාජ්‍ය ණය සහ දළ දේශීය නිෂ්පාදිතය යන දෙක ම පහළ යාම ය.
    (4) රාජ්‍ය ණය ස්ථාවර ව පැවතිය දී දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම ය.
    (5) රාජ්‍ය ණය ඉහළ යාමට වඩා දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම ය.

35. පෞද්ගලික ප්‍රතිලාභවලට වඩා වැඩි සමාජ ප්‍රතිලාභ පවතින්නේ,
    (1) අධ්‍යාපනය සහ සෞඛ්‍ය යන සේවාවන්වල ය.
    (2) යටිතල පහසුකම් සහ පරිසර සංරක්ෂණ කටයුතුවල ය.
    (3) වරාය සහ ගුවන්තොටුපල සේවාවන්වල ය.
    (4) මහාමාර්ග සහ රෝහල් සේවාවන්වල ය.
    (5) ජාතික උද්‍යාන සහ පරිසර සංරක්ෂණ කටයුතුවල ය.


36. නිෂ්පාදනය දිරිගන්වන සැපයුම්-පාර්ශවීය (supply-side) ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වන්නේ,
    (1) නිෂ්පාදන සහනාධාර, නියාමනහරණය, බදු ප්‍රතිසංස්කරණ සහ ජනසතුකරණය ය.
    (2) බදු ප්‍රතිසංස්කරණ, ජනසතුකරණය, නියාමනහරණය සහ ශ්‍රම හා ප්‍රාග්ධන වෙළෙඳපොළවල දෘඪතා ඉවත් කිරීම ය.
    (3) නියාමනකරණය, බදු ප්‍රතිසංස්කරණ, පරිපාලන හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම සහ ශ්‍රම හා ප්‍රාග්ධන වෙළෙඳපොළවල ප්‍රතිසංස්කරණ කිරීම ය.
    (4) නිෂ්පාදන සහනාධාර, පරිපාලන හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම, නියාමනහරණය සහ වෙළෙඳ සීමා පැනවීම ය.
    (5) බදු ප්‍රතිසංස්කරණ, පෞද්ගලීකරණය, නියාමනහරණය සහ ශ්‍රම හා ප්‍රාග්ධන වෙළෙඳපොළවල ප්‍රතිසංස්කරණ කිරීම ය.

37. මෑත වර්ෂවල ශ්‍රී ලංකා ආර්ථිකයේ ඉහළ වර්ධන වේගයක් වාර්තා කර ඇති අංශ වන්නේ,
    (1) ප්‍රවාහනය, තොග හා සිල්ලර වෙළෙඳාම සහ තොරතුරු හා සන්නිවේදනය වේ.
    (2) සංචාරක කර්මාන්තය, ඇඟලුම් කර්මාන්තය සහ මැණික් හා ස්වර්ණාභරණ වේ.
    (3) ඉදිකිරීම් කර්මාන්තය, හෝටල් හා ආපනශාලා සහ පතල් හා කැණීම් වේ.
    (4) ඉදිකිරීම් කර්මාන්තය, ඇඟලුම් කර්මාන්තය සහ තොග හා සිල්ලර වෙළෙඳාම වේ.
    (5) හෝටල් හා ආපනශාලා, සංචාරක කර්මාන්තය සහ ප්‍රවාහනය වේ.

38. නිරපේක්ෂ සහ සාපේක්ෂ දරිද්‍රතා මැන බැලීම සඳහා යොදාගත හැකි දර්ශක දෙක පිළිවෙළින්,
    (1) ජිනි සංගුණකය සහ ගෘහස්ත විදුලි පරිභෝජනයයි.
    (2) ආදායමේ දශක කොටස් (income percentiles) සහ ජිනි සංගුණකයයි.
    (3) කුටුම්භ ආදායම් මට්ටම සහ ආරක්ෂිත පානීය ජල සැපයුමයි.
    (4) දරිද්‍රතා ඉම (poverty line) සහ ජිනි සංගුණකයයි.
    (5) මාතෘ පෝෂණය සහ ආරක්ෂිත පානීය ජල සැපයුමයි.

[ශයවන පිටුව බලන්න.

39. කිසියම් භාණ්ඩයක වෙළෙඳපොළ සමතුලිතය සහ ආනයනික සැපයුම පහත රූප සටහනෙන් දැක්වේ.




මෙම රූප සටහනට අනුව, ආනයනික සැපයුම හේතුවෙන් සමාජයට ලැබෙන අමතර වාසිය දැක්වෙන ප්‍රදේශය වන්නේ,

(1) A හා B ය.
(2) B හා C ය.
(3) B හා G ය.
(4) C හා F ය.
(5) G, C හා F ය.

40. පහත සඳහන් කරුණු අතුරෙන් රටවල් අතර වෙළෙඳාමක් හට ගැනීමට හේතුවක් **නොවන්නේ**,

(1) රටවල් අතර සාධක උරුමය වෙනස් වීමයි.
(2) රටවල් අතර විදේශ විනිමය අනුපාතික වෙනස් වීමයි.
(3) රටවල් අතර තාක්ෂණික දැනුම වෙනස් වීමයි.
(4) නිෂ්පාදනයේ පරිමාණානුකූල ඵල පැවතීමයි.
(5) රටවල් අතර පාරිභෝගික රුචිය සහ තෝරා ගැනීමේ වෙනස් වීමයි.

41. කිසියම් ආර්ථිකයක් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | ඒක පුද්ගල ආදායම (ඇ.එ.ජ. ඩොලර් වලින්) | ජිනි සංගුණකය |
|---|---|---|
| 2011 | 2 400 | 0.46 |
| 2012 | 2 800 | 0.47 |
| 2013 | 3 200 | 0.48 |

මෙම ආර්ථිකය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) ආර්ථික ප්‍රසාරණයක් සමඟ ආදායම් විෂමතාව අඩු වීමක් ඇති බවයි.
(2) ආර්ථික සංකෝචනයක් සමඟ ආදායම් විෂමතාව වැඩි වීමක් ඇති බවයි.
(3) ආර්ථික සංකෝචනයක් සමඟ ආදායම් විෂමතාව අඩු වීමක් ඇති බවයි.
(4) ආර්ථික ප්‍රසාරණයක් සමඟ ආදායම් විෂමතාව වැඩි වීමක් ඇති බවයි.
(5) ආර්ථික ප්‍රසාරණයක් හෝ ආදායම් විෂමතාවයේ අඩු වීමක් නොමැති බවයි.

42. තිරසාර සංවර්ධනයේ ප්‍රධාන පැතිකඩ වන්නේ,

(1) ආර්ථික සංවර්ධනය, අනාගත පරම්පරා සඳහා සම්පත් ඉතිරි කිරීම සහ ආදායම් විෂමතාව අවම වීමයි.
(2) ආර්ථික සංවර්ධනය, සමාජ තත්ත්වය උසස් වීම සහ ආදායම් විෂමතාව අවම වීමයි.
(3) සමාජ තත්ත්වය උසස් වීම, දිළින්දන්ට හිතකර වර්ධනය සහ පරිසර සංරක්ෂණයයි.
(4) පරිසර සංරක්ෂණය, අන්තර්ගත වර්ධනය (Inclusive growth) සහ සේවා නියුක්තිය ඉහළ යාමයි.
(5) ආර්ථික සංවර්ධනය, සමාජ තත්ත්වය උසස් වීම සහ පරිසර සංරක්ෂණයයි.

43. යම් දෙන ලද යෙදවුම් ප්‍රමාණයකින් ශ්‍රී ලංකාවට සහ ඉන්දියාවට ලබාගත හැකි නිමවුම් ප්‍රමාණය පහත වගුවේ දැක්වේ.

| භාණ්ඩය | ශ්‍රී ලංකාව | ඉන්දියාව |
|---|---|---|
| තේ (ඒකක) | 100 | 90 |
| ඇඟලුම් (ඒකක) | 120 | 100 |

ඉහත තොරතුරුවලට අනුව නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) තේ නිෂ්පාදනයේ සාපේක්ෂ අවාසිය පවතින්නේ ඉන්දියාවට ය.
(2) ඇඟලුම් නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය පවතින්නේ ශ්‍රී ලංකාවට ය.
(3) තේ නිෂ්පාදනයේ නිරපේක්ෂ වාසිය පවතින්නේ ඉන්දියාවට ය.
(4) රටවල් දෙකට ම භාණ්ඩ දෙක ම නිෂ්පාදනය සම්බන්ධයෙන් සාපේක්ෂ වාසියක් පවතී.
(5) භාණ්ඩ දෙක ම සම්බන්ධයෙන් ඉන්දියාවට සාපේක්ෂ වාසියක් නොමැත.

[අත්වන පිටුව බලන්න.

44. මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපයීමේ ප්‍රධාන මූලාශ්‍ර **පහ** මොනවා ද?
(1) ඇඟලුම්, තේ, පොල්, මැණික් සහ පරිගණක මෘදුකාංග
(2) ඇඟලුම්, තේ, පොල්, රබර් සහ පරිගණක මෘදුකාංග
(3) ආමුඛ ප්‍රේෂණ, ඇඟලුම්, සංචාරක ඉපයුම්, තේ සහ රබර්
(4) ආමුඛ ප්‍රේෂණ, ඇඟලුම්, පරිගණක මෘදුකාංග, සංචාරක ඉපයුම් සහ තේ
(5) මැණික් හා ස්වර්ණාභරණ, තේ, පොල්, රබර් සහ ඛණිජ

45. පහත දැක්වෙන අය අතුරෙන් සේවා වියුක්තිකයකු ලෙස සැලකිය හැකි වන්නේ කවරකු ද?
(1) උපාධිය සමත් වී ලිපිකරුවකු ලෙස පෞද්ගලික අංශයේ සේවය කරන පුද්ගලයෙකි.
(2) වයස්ගත දෙමාපියන් රැකබලා ගැනීම සඳහා රැකියාව අත්හළ පුද්ගලයෙකි.
(3) උසස් අධ්‍යාපනය සඳහා ස්ථිර රැකියාවෙන් ඉවත් වූ පුද්ගලයෙකි.
(4) දරුවන් රැකබලා ගැනීම සඳහා නිවසේ රැඳී සිටි නමුත් දැන් රැකියාවක් සොයන කාන්තාවකි.
(5) විභාග කාල සීමාවේ දී තම පවුලේ ගොවිපොළෙහි වැඩෙහි නිරත නොවන පාසල් සිසුවෙකි.

46. මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයෙහි ඇති වූ ප්‍රධාන වෙනස්කමක් වන්නේ,
(1) ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය ඉහළ යාම ය.
(2) ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය පහළ යාම ය.
(3) පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය ඉහළ යාම ය.
(4) ස්ත්‍රී සේවා නියුක්තිය පහළ යාම ය.
(5) පුරුෂ සේවා වියුක්තිය සැලකිය යුතු මට්ටමකින් ඉහළ යාම ය.

47. ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන දර්ශකය කෙටි කලකින් ඉහළ නැංවීම සඳහා තවදුරටත් අවධානය යොමු කළ යුතු අනු දර්ශක කවරේ ද?
(1) ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සහ උපතේ දී ආයු අපේක්ෂණය
(2) සාක්ෂරතා අනුපාතිකය සහ මාතෘ මරණ අනුපාතිකය
(3) මාතෘ මරණ අනුපාතිකය සහ ළදරු මරණ අනුපාතිකය
(4) ඒක පුද්ගල ආදායම සහ පාසල් හැරයන්නන්ගේ අනුපාතිකය
(5) අධ්‍යාපනයේ සහභාගීත්ව අනුපාතිකය සහ ක්‍රය ශක්ති සාම්‍ය මිල මත ගණනය කළ ඒක පුද්ගල ආදායම

48. 2012 වසරේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය, සේවා වියුක්ති අනුපාතිකය සහ උද්ධමන අනුපාතිකය දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

| | ආර්ථික වර්ධන අනුපාතිකය (%) | සේවා වියුක්ති අනුපාතිකය (%) | උද්ධමන අනුපාතිකය (%) |
|---|---|---|---|
| (1) | 5.6 | 5.5 | 8.0 |
| (2) | 7.5 | 6.0 | 4.0 |
| (3) | 7.0 | 8.9 | 9.0 |
| (4) | 6.4 | 4.0 | 7.6 |
| (5) | 8.3 | 8.9 | 4.0 |

49. ශ්‍රී ලංකාවේ නුපුහුණු කාන්තා ශ්‍රමිකයින් මැද පෙරදිග රටවලට රැකියා සඳහා සංක්‍රමණය වීමේ දී ඇතිවන අහිතකර ප්‍රතිවිපාක අවම කර ගැනීම සඳහා රජය විසින් මෑත කාලයේ දී ගෙන ඇති ප්‍රතිපත්ති තීරණ වන්නේ,
(1) සේවය කළ හැකි උපරිම කාලය තීරණය කිරීම සහ අනේවාසික ගිණුමේ පවත්වාගෙන යා යුතු අවම ශේෂය තීරණය කිරීම ය.
(2) අනේවාසික විදේශ විනිමය ගිණුමක් විවෘත කිරීම සහ අවම වශයෙන් වසර තුනක සේවා ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම ය.
(3) අවම වයස් සීමාව තීරණය කිරීම සහ පවුල් පසුබිම පිළිබඳ වාර්තාවක් ලබා ගැනීම ය.
(4) අවම වයස් සීමාව තීරණය කිරීම සහ අවම වශයෙන් වසර තුනක සේවා ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම ය.
(5) අනේවාසික විදේශ විනිමය ගිණුමක් විවෘත කිරීම සහ විදේශගත ව සේවය කළ හැකි උපරිම කාලය තීරණය කිරීම ය.

50. ගෝලීයකරණයේ ප්‍රධාන ගාමක බලවේග ලෙස සැලකෙන්නේ,
(1) ප්‍රවාහන ක්ෂේත්‍රයේ වර්ධනය සහ ආරක්ෂණවාදී වෙළෙඳ ප්‍රතිපත්ති පවත්වාගෙන යාම ය.
(2) ආරක්ෂණවාදී වෙළෙඳ ප්‍රතිපත්ති ඉවත් කිරීම සහ තාක්ෂණයේ වර්ධනය ය.
(3) බහුජාතික සමාගම්වල ව්‍යාප්තිය සහ ශ්‍රම වෙළෙඳපොළේ දෘඪතා පැවතීම ය.
(4) ආර්ථික ඒකාබද්ධ වීම සහ ආරක්ෂණවාදී වෙළෙඳ ප්‍රතිපත්ති පවත්වාගෙන යාම ය.
(5) වෙළෙඳපොළ නියාමනහරණය සහ අපූර්ණ තරගයක් පැවතීම ය.

* * *

86282

AL/2014/21/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2014 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப் பரீட்சை, 2014 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2014

ආර්ථික විද්‍යාව II
பொருளியல் II
Economics II

21 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**උපදෙස් :**

* "අ" උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, "ආ" උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

## "අ" උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

1. (i) සමාජයන් සැමවිට ම තෝරා ගැනීමේ ගැටලුවකට මුහුණ දෙන්නේ ඇයි දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
   (ii) ව්‍යවසායකත්වය අනෙක් නිෂ්පාදන සාධකයන්ගෙන් වෙනස්වන්නේ කෙසේ ද? (ලකුණු 04 යි)
   (iii) 'ප්‍රාග්ධනය' හා 'ආයෝජනය' අතර වෙනස දක්වන්න. (ලකුණු 04 යි)
   (iv) රටක මානව සම්පතෙහි ඵලදායීතාව වැඩිකිරීමට ගතහැකි ක්‍රියාමාර්ග කවරේ ද? (ලකුණු 04 යි)
   (v) වෙළෙඳපොළ ආර්ථිකයක නිෂ්පාදන තාක්ෂණය තෝරා ගැනීම පිළිබඳ ගැටලුව විසඳා ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

2. (i) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් යනු කුමක් දැ'යි රූපසටහනක් භාවිතයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
   (ii) නිෂ්පාදන සම්පත් භාවිතයේ දී වැඩෙන ආවස්ථික පිරිවැයක් ඇතිවන්නේ කවර හේතු නිසා දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
   (iii) පහත දැක්වෙන සංසිද්ධීන් නිෂ්පාදන හැකියා මායිම් රූපසටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න.
   (අ) රටකින් බැහැර ව සිටි වෘත්තිකයන් සැලකිය යුතු පිරිසක් නැවත පැමිණීම (ලකුණු 02 යි)
   (ආ) ස්වාභාවික ආපදාවක් හේතුවෙන් රටක ප්‍රාග්ධන සම්පත් විනාශ වීම (ලකුණු 02 යි)
   (ඉ) මාර්ග පද්ධතියේ පුළුල්වීමක් හේතුකොට ගෙන මෙතෙක් භාවිත නොවූ ග්‍රාමීය සම්පත් නිෂ්පාදනයට යොමුවීම (ලකුණු 02 යි)
   (ඊ) ඇඟලුම් කර්මාන්තයට සාපේක්ෂ ව සංචාරක කර්මාන්තය වැඩි වේගයකින් ප්‍රසාරණය වීම (ලකුණු 02 යි)
   (iv) ආර්ථිකයක දෙන ලද තාක්ෂණය යටතේ පවතින සම්පත් පූර්ණ වශයෙන් සේවා නියුක්ත කළ පසු නිෂ්පාදනය කළ හැකි X සහ Y භාණ්ඩ සංයෝග පහත වගුවේ දැක්වේ.

| නිෂ්පාදන සංයෝග | X භාණ්ඩයේ ඒකක | Y භාණ්ඩයේ ඒකක |
|---|---|---|
| A | 0 | 150 |
| B | 20 | 140 |
| C | 40 | 125 |
| D | 60 | 105 |
| E | 80 | 70 |
| F | 100 | 0 |

   (අ) මෙම ආර්ථිකයේ නිෂ්පාදන සංයෝග (A-B, B-C, C-D, D-E සහ E-F) අතර ආවස්ථික පිරිවැය ගණනය කරන්න. (ලකුණු 02 යි)
   (ආ) ඉහත සංඛ්‍යා සටහනට අනුව, X භාණ්ඩයෙන් ඒකක 40 ක සහ Y භාණ්ඩයෙන් ඒකක 60 ක සංයෝගයක් නිපදවන අවස්ථාවේ සිට X භාණ්ඩයෙන් ඒකක 60 ක සහ Y භාණ්ඩයෙන් ඒකක 80 ක සංයෝගයක් නිපදවන අවස්ථාව දක්වා මාරුවීමේ දී ආවස්ථික පිරිවැයක් පවතින්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 02 යි)

3. (i) ජංගම දුරකථන සඳහා වෙළෙඳපොළ ඉල්ලුම තීරණය කරන සාධක කවරේ ද? (ලකුණු 05 යි)
   (ii) භාණ්ඩයක මිල හා සැපයුම් ප්‍රමාණය අතර පවතින අනුලෝම සම්බන්ධතාව රඳාපවතින ප්‍රධාන කරුණු මොනවා ද? (ලකුණු 05 යි)
   (iii) භාණ්ඩයක සැපයුම කෙරෙහි බලපාන 'අන් භාණ්ඩවල මිල' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 05 යි)
   (iv) "නිදහස් වෙළෙඳපොළක සමතුලිතයක් ඇතිවීම සඳහා උපරිම ඉල්ලුම් ප්‍රමාණයට වඩා අවම සැපයුම් ප්‍රමාණය අඩුවිය යුතු ය" මෙම ප්‍රකාශය රූපසටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

[දෙවෙනි පිටුව බලන්න

4. කිසියම් භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් සහ සැපයුම් සමීකරණ පහත දැක්වේ.

$Qd = 150 - 5P$ (ඉල්ලුම් සමීකරණය)

$Qs = 75 + 10P$ (සැපයුම් සමීකරණය)

ඉහත තොරතුරු ඇසුරෙන් පහත දෑ ගණනය කරන්න.

(i) වෙළෙඳපොළ සමතුලිත මිල සහ ප්‍රමාණය (ලකුණු 02 යි)

(ii) වෙළෙඳපොළ සමතුලිතයේ දී පවතින පාරිභෝගික අතිරික්තයේ වටිනාකම (ලකුණු 03 යි)

(iii) සමතුලිත මිලේ දී ඉල්ලුම් නම්‍යතා සහ සැපයුම් නම්‍යතා සංගුණකවල වටිනාකම (ලකුණු 04 යි)

(iv) රජය විසින් මෙම භාණ්ඩය මත රු. 1.50 ක ඒකක බද්දක් පැන වූ විට,

(අ) බද්දෙන් පසු නව සමතුලිත මිල සහ ප්‍රමාණය (ලකුණු 02 යි)

(ආ) රජයේ බදු ආදායම (ලකුණු 03 යි)

(ඉ) බද්ද හේතුවෙන් පාරිභෝගික අතිරික්තයට වන බලපෑම (ලකුණු 03 යි)

(ඊ) බද්ද නිසා සමාජයට අහිමි ව යන සුභසාධනයේ වටිනාකම (ලකුණු 03 යි)

5. පහත දැක්වෙන්නේ කල්පිත ආර්ථිකයක දෙන ලද වර්ෂයක් සඳහා අදාළ තොරතුරු ය.
(සියලු ම අගයන් රු. මිලියන වලිනි.)

| | |
|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම | 800 |
| රජයේ මිල දී ගැනීම් | 150 |
| ආනයන | 60 |
| දේශීය පෞද්ගලික ආයෝජන | 200 |
| විදේශීය සාධක ඉපයීම් | 40 |
| තොග වෙනස්වීම් | 50 |
| ක්ෂයවීම් | 40 |
| අපනයන | 80 |
| විදේශයන්ට කළ සාධක ගෙවීම් | 60 |
| අඩුදුව්‍ය මිල දී ගැනීම් | 20 |
| කොටස් හා බැඳුම්කර මිල දී ගැනීම් | 15 |

(i) මෙම ආර්ථිකයේ,

(අ) සමාහාර ඉල්ලුම් සමීකරණය ගොඩනගන්න. (ලකුණු 03 යි)

(ආ) දළ දේශීය වියදම ගණනය කරන්න. (ලකුණු 03 යි)

(ඉ) දළ ජාතික වියදම ගණනය කරන්න. (ලකුණු 03 යි)

(ඊ) ශුද්ධ ජාතික වියදම ගණනය කරන්න. (ලකුණු 03 යි)

(ii) සරල ආර්ථිකයක සාර්ව ආර්ථික සමතුලිතය රූපසටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) ආයෝජන ගුණකය ජාතික ආදායම නිර්ණය සඳහා කොපමණ බලපෑමක් කරන්නේ ද? උදාහරණයක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

## "ආ" උප කොටස

(මෙම කොටසෙන් ද අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

6. (i) ගනුදෙනු චේතනාව සඳහා මුදල් ඉල්ලුම සහ ආදායම අතර පවතින සම්බන්ධතාව රූපසටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(ii) රටක මුදල් සැපයුම තීරණය කිරීමේ දී ණයපත් (Credit card) සැලකිල්ලට ගැනීමටත්, හරපත් (Debit card) සැලකිල්ලට නොගැනීමටත් හේතුව පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iii) ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු මොනවා ද? මෙම අරමුණු ඉටුකර ගන්නේ කෙසේ දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) රටක මුදල් සැපයුම පාලනය කිරීම සඳහා මහ බැංකුව විසින් භාවිත කරන ගුණාත්මක ණය පාලන උපකරණ පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

7. (i) වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ ප්‍රධාන කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(ii) ආර්ථික වර්ගීකරණයට අනුව රාජ්‍ය වියදම් වර්ග කර දක්වන්න. (ලකුණු 05 යි)

(iii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයවැය හිඟය පියවා ගැනීමට මෑතකාලයේ දී යොදාගත් ප්‍රධාන මූලාශ්‍ර මොනවා ද? (ලකුණු 05 යි)

(iv) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය අනුපාතිකයේ මෑතකාලීන ප්‍රවණතා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

8. ශ්‍රී ලංකාව සහ චීනය යන රටවල් දෙක යන්ත්‍ර සූත්‍ර සහ ඇඟලුම් යන භාණ්ඩ නිෂ්පාදනයේ යෙදේ. දෙන ලද යෙදවුම් භාවිතයෙන් රටවල් දෙක විසින් එක් එක් භාණ්ඩයෙන් නිපදවන ප්‍රමාණ පිළිබඳ කල්පිත තොරතුරු පහත වගුවේ දැක්වේ.

| රට | යන්ත්‍ර සූත්‍ර (ඒකක) | ඇඟලුම් (ඒකක) |
|---|---|---|
| චීනය | 50 | 150 |
| ශ්‍රී ලංකාව | 10 | 50 |

ඉහත වගුවේ දැක්වෙන තොරතුරු භාවිතයෙන් පහත (i) සහ (ii) කොටස්වලට පිළිතුරු සපයන්න.

(i) කුමන රටක් කුමන භාණ්ඩයක් සඳහා විශේෂීකරණය විය යුතු ද? පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(ii) විශේෂීකරණයට පසු ව රටවල් දෙක අතර වෙළෙඳ අනුපාතය කුමක් ද? (ලකුණු 05 යි)

(iii) නිදහස් වෙළෙඳාම සීමා කෙරෙන තීරුබදු සහ තීරුබදු නොවන බාධක මොනවා ද? (ලකුණු 05 යි)

(iv) නිදහස් වෙළෙඳාමට රටවල් බාධා පමුණුවන්නේ ඇයි දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

9. (i) ආර්ථික වෘද්ධිය යන්න නිර්වචනය කරන්න. එය මනිනු ලබන්නේ කෙසේ ද? (ලකුණු 05 යි)

(ii) රටක ආර්ථික වෘද්ධිය සමඟ ජාතික නිෂ්පාදනයෙහි ඇතිවිය හැකි ව්‍යුහාත්මක වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iii) 'ආර්ථික සංවර්ධනය බහුමාන ක්‍රියාවලියකි'. පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) ශ්‍රී ලංකාවේ දිළිඳුකමේ මෑතකාලීන උපනතීන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

10. (i) මෑත වර්ෂවල දී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය තීරණය කළ ප්‍රධාන සාධක මොනවා ද? (ලකුණු 05 යි)

(ii) ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ සේවා අංශයේ වැදගත්කම සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iii) ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශයේ ඉහළ වර්ධනයක් ඇති කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 05 යි)

(iv) මෑතකාලීන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

***